(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 115.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2021 නොවැම්බර් 23 අඟහරුවාදා පූ.භා. 9.30 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

459/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලීටර් 13,200ක ඉන්ධන ප්‍රවාහන ධාරිතාවයකින් යුත් ටැංකි සහිත රථ 05ක් මිලදී ගැනීම සඳහා 2016 වර්ෂයේදී අමාත්‍යාංශය විසින් ටෙන්ඩර් කැඳවීමක් සිදු කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ටෙන්ඩරය කැඳවනු ලැබුවේ කවුරුන් විසින්ද;

(iii) එම ටෙන්ඩරය එවකට අදාළ අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව වෙත යොමු කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම රථ 05 මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුළු මුදල;

(ii) එක් රථයක් මිලදී ගැනීම සඳහා වැය කරන ලද මුදල;

(iii) එම රථ මිලදී ගන්නා අවස්ථාව වනවිට එක් රථයක වෙළඳපොළ වටිනාකම;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

713/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාව තුළ පිහිටා ඇති රජය සතු අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) මේ වනවිට එම මධ්‍යස්ථානවලින් නිෂ්පාදනය කරනු ලබන දේශීය රෙදිපිළි වර්ග කවරේද;

(iv) අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා රජයෙන් ලබා දී ඇති සහන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම නිෂ්පාදන විදේශ වෙළෙඳපොළට අලෙවි කරන්නේද;

(ii) එසේ නම්, එම රටවල් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

840/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කය, අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය සඳහා ප්‍රසිද්ධියක් උසුලන බවත්;

(ii) අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්තය තුළින් වැඩි වශයෙන් ආයෝජන අවස්ථා ලබා ගත හැකි බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ අත්‍යන්ත්‍ර පේෂ කර්මාන්ත ශාලා කිහිපයක් ඉදිකිරීමට පියවර ගන්නේද;

(ii) ඉහත අ(ii)හි සඳහන් ආයෝජන අවස්ථා සෘජුවම කර්මාන්තයේ නියැලෙන්නන්ට ලබාදීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1647/2021

ගරු මුජිබුර් රහුමාන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේදී කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව එම සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) කොළඹ දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව පැතිරෙමින් පවතින ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා මේ වනවිට ගෙන ඇති විශේෂ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1830/2021

ගරු චාමර සම්පත් දසනායක මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා ගෙවනු ලබන මාසික වැටුපට අමතරව පසුගිය රජයේ ආණ්ඩු පාර්ශ්වය නියෝජනය කරන ලද පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා 2017 සහ 2018 වර්ෂවලදී දීමනාවක් ගෙවා තිබේද;

(ii) එසේ නම්, එම දීමනාව කොපමණද;

(iii) එම ගෙවීම සඳහා නීත්‍යානුකූල පදනමක් තිබේද;

(iv) ඉහත දීමනාව ගෙවන ලද අමාත්‍යාංශයේ/කාර්යාලයේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සඳහා ඉහත දීමනාව ගෙවීමට හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් මේ වනවිට ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(iii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*අ1.

විසර්ජන පනත් කෙටුම්පත — (අටවැනි වෙන් කළ දිනය) — කාරක සභාව.

*2.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2013),— 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2018.02.20 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික චිත්‍රපට සංස්ථාවේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*3.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ජාතික චිත්‍රපට සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2014),— 1980 අංක 45 දරන පනතින් සංශෝධිත 1971 අංක 47 දරන ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථා පනතේ 32(1) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(1) වගන්තිය යටතේ 2018.02.20 දින ඉදිරිපත් කරන ලද 2014.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික චිත්‍රපට සංස්ථාවේ 2014 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*4.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා (2013 හා 2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.03.09 දින ඉදිරිපත් කරන ලද 2013.12.31 හා 2014.12.31 දිනයන්ගෙන් අවසන් වූ වර්ෂ සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2013 සහ 2014 වර්ෂ සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තා අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*5.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2018.10.10 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2015 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*6.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.06.06 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2016 වර්ෂය සඳහා සීමාසහිත ලංකා එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*7.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය (2015),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.02.21 දින ඉදිරිපත් කරන ලද 2015.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2015 වර්ෂයේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශනය අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*8.

ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2019.02.22 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් 2016 වර්ෂයේ සැලසිනේ රූපවාහිනී ආයතනයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(නෛතික කටයුතු (දූෂණ විරෝධී) හා මාධ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.01.24 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*9.

ප්‍රවාහන අමාත්‍යතුමිය,— ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව (2016),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2019.06.19 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනා ගමන කොමිෂන් සභාවේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ප්‍රවාහනය හා සන්නිවේදනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2020.02.05 දින සලකා බලා එකී වාර්තාව 2020.02.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*10.

කම්කරු අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදලේ වාර්ෂික වාර්තාව (2016),— 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතේ 6(3)(4) වන වගන්තිය යටතේ 2019.02.05 දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සේවක අර්ථසාධක අරමුදලේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2019.11.07 දින සලකා බලා එකී වාර්තාව 2020.01.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*11.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව (2013),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වන වගන්තිය යටතේ 2016.10.05 වන දින ඉදිරිපත් කරන ලද 2013.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2013 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2019.11.07 දින සලකා බලා එකී වාර්තාව 2020.01.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*12.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව (2016),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වන වගන්තිය යටතේ 2019.01.10 වන දින ඉදිරිපත් කරන ලද 2016.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2016 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2019.11.07 දින සලකා බලා එකී වාර්තාව 2020.01.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*13.

කම්කරු අමාත්‍යතුමා,— ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව (2017),— 2009 අංක 38 දරන ජාතික වෘත්තීය ආරක්ෂණ සහ සෞඛ්‍ය පිළිබඳ ආයතනය පනතේ 18 වන වගන්තිය යටතේ 2019.08.08 වන දින ඉදිරිපත් කරන ලද 2017.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද, විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ 2017 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(අධ්‍යාපන හා මානව සම්පත් සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2019.11.07 දින සලකා බලා එකී වාර්තාව 2020.01.07 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*14.

සංචාරක අමාත්‍යතුමා,— සිවිල් ගුවන් සේවා පනත යටතේ නියෝග,— 2010 අංක 14 දරන සිවිල් ගුවන් සේවා පනතේ 117(2)(ඩ) වගන්තිය යටතේ සංචාරක අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 සැප්තැම්බර් 08 දිනැති අංක 2192/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.08 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා,— වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙළවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 09 දිනැති අංක 2222/62 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.07 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*16.

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 1),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ඣඅ) සහ (ඣආ) වගන්තිය යටතේ කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර සහ ජලජ සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 ජුනි 03 දිනැති අංක 2126/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*17.

ධීවර අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග (අංක 2),— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61(1)(ද) වගන්තිය යටතේ ධීවර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මාර්තු 12 දිනැති අංක 2218/64 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*18.

කර්මාන්ත අමාත්‍යතුමා,— ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග,— 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 14(1)(ඊ) සහ 15 වගන්ති සමඟ කියවිය යුතු 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමණාකරණ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 මාර්තු 02 දිනැති අංක 2165/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ සහ එම ගැසට් පත්‍රයේ මුද්‍රණ දෝෂ නිවැරදි කරමින් 1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 53 වගන්තිය යටතේ කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 අප්‍රේල් 01 දිනැති අංක 2221/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*19.

අධිකරණ අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝග,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 45(1අ) වගන්තිය සමඟ කියවිය යුතු 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 මැයි 03 දිනැති අංක 2226/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.10.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*20.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ රෙගුලාසි,— 1996 අංක 27 දරන පනතින් සංශෝධිත 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 5(ඊ) වගන්තිය සමඟ කියවිය යුතු 71(2)(අ) වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2019 අගෝස්තු 02 දිනැති අංක 2134/56 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.11.09 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*21.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— සංශෝධිත (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ජූනි 30 දිනැති අංක 2234/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.11.08 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 08/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*22.

මුදල් අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— සංශෝධිත (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 8 සහ 30 වගන්ති සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අගෝස්තු 16 දිනැති අංක 2241/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.11.08 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 09/2021 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*23.

මුදල් අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— සංශෝධිත පරිදි, 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අගෝස්තු 03 දිනැති අංක 2239/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.11.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*24.

මුදල් අමාත්‍යතුමා,— ගුවන් තොටුපළ සංවර්ධන බදු පනත යටතේ නියමය,— 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු පනතේ 3(3) වගන්තිය යටතේ වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 අගෝස්තු 11 දිනැති අංක 2240/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.11.08 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*25.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,—1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 ඔක්තෝබර් 12 දිනැති අංක 2249/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.11.09 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*26.

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*27.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

පුද්ගලනාශක බිම්බෝම්බ තහනම් කිරීම පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ජාතික ආරක්ෂක විශ්වවිද්‍යාලය පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2021 ජූලි 08) [1].

*31.

මුදල් අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2021 මැයි 06 දිනැති අංක 2226/48 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.06.23 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*32.

අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා,— 2015 ජනවාරි මස 08 වැනි දින සිට 2019 නොවැම්බර් මස 16 වන දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයින්, සන්නද්ධ හමුදාවන් හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයින්ට සිදු වී ඇතැයි කියන දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම,—

උක්ත කරුණ සම්බන්ධයෙන් අතිගරු ජනාධිපතිතුමා විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2021.01.15 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අමප/21/0105/301/003 හා 2021.02.15 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලබා දී ඇත:—

(අ) ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාව (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) යෝජනා සම්මතයක් මඟින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම;

(ආ) එම අවසන් වාර්තාවේ පළමුවැනි වෙළුමේ අයිතම අංක 08 හි සඳහන් දූෂණ විරෝධී කමිටුව සම්බන්ධයෙන් එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම;

(ඇ) එකී අයිතම අංක 08 හි සඳහන් තීරණ අංක 1 සහ නිර්දේශ අංක 1 ක්‍රියාත්මක කිරීම සඳහා විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම හෝ පාර්ලිමේන්තුව විසින් ඒ සඳහා නිශ්චය කරනු ලබන වෙනත් සුදුසු යාන්ත්‍රණයක් නිර්මාණය කිරීම;

(ඈ) ඉහත කී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි හා තෙවැනි වෙළුම්වල සහ එම අවසන් වාර්තාවේ යතුරුලියන දෝෂ හා මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨයේ අයිතම අංක 08 හි සහ අයිතම අංක 09 හි I සිට LXI දක්වා පැමිණිලිවලට අදාළව එම කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිණිස එකී තීරණ හා නිර්දේශ, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පොලිස්පති, අදාළ අමාත්‍යාංශ භාර අමාත්‍යවරුන් සහ අමාත්‍යාංශ ලේකම්වරුන් ඇතුළු අදාළ බලධාරීන් වෙත යොමු කිරීම; සහ

(ඉ) එකී අවසන් වාර්තාවේ තෙවැනි වෙළුමෙ හි අයිතම අංක 10 යටතේ සඳහන් පැමිණිලිවලට අදාළව එකී ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාව විසින් ලබා දී ඇති තීරණ හා නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

ඊට අනුකූලව, ඉහත (ඇ) හි සඳහන් පරිදි අංක 2221/54 සහ 2021.04.01 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය මඟින් අතිගරු ජනාධිපතිතුමා විසින් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවක් පත්කර ඇති හෙයින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ ඇතුළත් අයිතම අංක 08 හි තීරණ සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විශේෂ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ වාර්තාව ලැබීමෙන් පසු සලකා බලනු ලැබීමට යටත්ව එකී අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් දේශපාලන පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගන්නා ලද ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභාවේ අවසන් වාර්තාවේ (එහි පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම් ද, යතුරුලියන දෝෂ සහ මුද්‍රණ දෝෂ නිවැරදි කිරීමේ පරිශිෂ්ඨය ද ඇතුළත්) අයිතම අංක 08 අත්හැර 09 සහ 10 අයිතමයන් හි ඇතුළත් තීරණ හා නිර්දේශ ඉහත (ඈ) සහ (ඉ) හි සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

33.

වත්කම් සහ වගකීම් ප්‍රකාශ කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

දුම්කොළ බදු (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

වයිට් රෝස් පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

රොෂාන් රණසිංහ ජනසහන පදනම සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

## දිනට නියමිත කටයුතුවලට අදාළ සංශෝධන පිළිබඳ දැනුම්දීම

අ1.

"විසර්ජන" පනත් කෙටුම්පතට කාරක සභාවේදී ඉදිරිපත් කරන සංශෝධන සඳහා වෙනම නිකුත් කළ "දිනට නියමිත කටයුතුවලට අදාළ අතිරේකය" නමැති පත්‍රිකාව බලන්න.

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---